## 2023-12-05 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. කොළඹ ආරක්ෂක සම්මේලනයේ ප්‍රඥප්තිය, අවබෝධතා ගිවිසුම හා මූලස්ථාන ගිවිසුම අත්සන් කිරීම

ඉන්දීය සාගර කලාපයේ සමුද්‍රීය ආරක්ෂාව ඇතුළුව සාමාජික රටවලට පොදු ආරක්ෂක තර්ජන හා අභියෝගවලට මුහුණ දීම මෙන්ම සාමාජික රටවල හර පද්ධතීන්ට ගරු කරමින් ක්‍රියාත්මක වන සම්මුතියක් වශයෙන් කොළඹ ආරක්ෂක සම්මේලනය ස්ථාපිත කරනු ලැබ ඇත. දැනට මෙම සම්මේලනය ඉන්දියාව, මාලදිවයින, මුරුසි රාජ්‍යය සහ ශ්‍රී ලංකාව සාමාජික රාජ්‍යයන් ලෙසත්, බංග්ලාදේශය සහ සීෂෙල්ස් රාජ්‍යය නිරීක්ෂණ රාජ්‍යයන් ලෙසත් කටයුතු කරනු ලබන කලාපීය සංවිධානයක් වශයෙන් ක්‍රියාත්මක වේ. එම සම්මේලනයේ කටයුතු වඩා විධිමත් කිරීම සඳහා ප්‍රඥප්තියක් අත්සන් කිරීමටත්, කොළඹ නගරයේ ස්ථාපිත කිරීමට යෝජිත එම සංවිධානයේ ලේකම් කාර්යාලයට අදාළව අවබෝධතා ගිවිසුමක් සාමාජික රටවල් අතර අත්සන් කිරීමටත් සහ ලේකම් කාර්යාලයේ කාර්යයන්ට අදාළව මූලස්ථාන ගිවිසුමක් ශ්‍රී ලංකාව හා ලේකම් කාර්යාලයේ ජනරාල්වරයා අතර අත්සන් තැබීමටත් ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ලෝක බැංකුව විසින් අරමුදල් සපයන මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස 2023-04-24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී තිබේ. එකී අනුමැතිය පරිදි පැවති ණය සම්මුති සාකච්ඡාවලදී ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ප්‍රාග්ධනීකරණය, මහ බැංකුවේ ආයතනික ධාරිතා සංවර්ධනය සහ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය යන සංරචකයන් යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 150ක ණය අරමුදල් සැපයීමට ලෝක බැංකුව එකඟතාව පළ කර ඇත. ඒ අනුව, අදාළ ගිවිසුම්වලට එළඹීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහාය දැක්වීම පිළිබඳ ගිවිසුම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මාලදිවයින් ජනරජය අතර සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහාය දැක්වීම පිළිබඳ ගිවිසුමට එළඹීම සඳහා 2022-09-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති නමුත්, මාලදිවයින පාර්ශ්වය විසින් යෝජිත ගිවිසුමට සංශෝධන කිහිපයක් පසුව යෝජනා කිරීම හේතුවෙන් එම ගිවිසුමට අත්සන් තබා නොමැත. ඉන් අනතුරුව, දෙපාර්ශ්වයේ එකඟතාව මත සංශෝධිත නව කෙටුම්පතක් පිළියෙල කරනු ලැබ ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, එකී ගිවිසුමට අත්සන් තැබීමටත්, ඉන් අනතුරුව එම ගිවිසුම දෙරටේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල විසින් අපරානුමත කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **දඬුවමට නියම වූ තැනැත්තන් භාර දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ලැට්වියා ජනරජය අතර එළැඹි ගිවිසුම**

ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් වෙනත් රටක පුරවැසියෙකු වරදකරු කොට දඬුවම් නියම කර බන්ධනාගාර ගත කරනු ලැබූ විට එම පුද්ගලයාගේ දඬුවම ඔහු පුරවැසියෙකු යැයි හිමිකම් පාන රට තුළ ගෙවා දැමීමට හැකි වන පරිදි අදාළ විධිවිධාන 1995 අංක 5 දරන වරදකරුවන් භාර දීමේ පනතේ ඇතුළත්ව ඇත. එමෙන්ම යම් නිශ්චිත රටකදී බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩනයකට ලක් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ඔහුගේ ඉතිරි දඬුවම් කාලය ශ්‍රී ලංකාවේ බන්ධනාගාරයක ගත කිරීම සඳහා වන විධිවිධාන ද එකී පනතේ ඇතුළත්ව තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාව සහ ලැට්වියා ජනරජය අතර වරදකරුවන් භාරදීම සම්බන්ධයෙන් වන ගිවිසුමකට අත්සන් තැබීමට යෝජනා වී ඇත. නීතිපති දෙපාර්තමේන්තුව සහ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සාකච්ඡා කර එකඟතාවකට එළඹ ඇති එකී ගිවිසුමට අත්සන් තැබීමටත් ඉන් අනතුරුව, එකී ගිවිසුම අපරානුමත කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **පාරවිලයන වෛද්‍ය වෘත්තිකයින්ගේ සහ සායනික කාර්යමණ්ඩලයේ සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම**

රුධිර පාරවිලයන වෛද්‍ය වෘත්තිකයින්ගේ සහ සායනික කාර්යමණ්ඩලයේ රුධිර පාරවිලයන වෛද්‍ය විද්‍යාව සම්බන්ධ දැනුම වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් අධ්‍යාපනික වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා යුරෝපා සංගමය විසින් රුපියල් මිලියන 41.28ක ප්‍රදානයක් ලබා දීමට එකඟතාව පළ කර ඇත. යෝජිත වැඩසටහන යුරෝපයේ, ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ කොළඹ ජාතික රුධිර පාරවිලයන සේවය හා ආසියානු රුධිර පාරවිලයන සංගමය යන හවුල්කරුවන්ගෙන් සමන්විත එකමුතුව විසින් පැවැත්වීමට තීරණය කර ඇත. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශ්වයන් අතර සාමූහික ගිවිසුමකට අත්සන් තැබීම පිණිස සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **හෘද රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා භාවිත කරනු ලබන එනොක්සපාරින් සෝඩියම් එන්නත් 1,450,000ක් සපයා ගැනීම සඳහා වන ප්‍රසම්පාදනයන්**

හෘද රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා භාවිත කරනු ලබන පෙර පුරවා ඇති එනොක්සපාරින් සෝඩියම් එන්නත් 6000 අයියූ, මි.ලී. 0.6 සිරින්ජර් 1,450,000ක් සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදනයන් 02ක් යටතේ ජාත්‍යන්තර ලංසු කැඳවා ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව පහත සඳහන් පරිදි ප්‍රසම්පාදනයන් පිරිනැමීම පිණිස සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* එනොක්සපාරින් සෝඩියම් එන්නත් 450,000ක් මිල දී ගැනීමේ ප්‍රසම්පාදනය M/s Gulf Pharma (Pvt.) Limited වෙත පිරිනැමීම සඳහා.
* එනොක්සපාරින් සෝඩියම් එන්නත් 1,000,000ක් මිල දී ගැනීමේ ප්‍රසම්පාදනය M/s Slim Pharmaceuticals (Pvt.) Limited වෙත පිරිනැමීම සඳහා.

**07. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සඳහා සංශෝධන**

හඳුනාගත් ඇතැම් අවස්ථානුගත තත්ත්වයන් යටතේ සැකකාර/චූදිත තැනැත්තන් අධිකරණය ඉදිරියේ පුද්ගලිකව පෙනී සිටීමේ අවශ්‍යතාව නඩු විභාගය අතරතුරදී පවා ඉවත් කළ හැකිද යන්න තීරණය කිරීම අපරාධ අධිකරණයට හැකි වන පරිදි නෛතිමය ප්‍රතිපාදන සැලසීම සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම පිණිස 2021-09-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සකස් කරන ලද පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර උනන්දුවක් දක්වන පාර්ශ්වයන් කිහිපයක් විසින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරනු ලැබ තිබේ. එකී කරුණු ද සැලකිල්ලට ගනිමින් දැනටමත් කෙටුම්පත් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත තවදුරටත් වැඩිදියුණු කර 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සඳහා සංශෝධනය කිරීම පිණිස නව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන (19 වන අධිකාරය) - දඩ මුදල් වැඩි කිරීම**

වර්තමාන මූල්‍ය අගයට සාපේක්ෂව දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් දඩ මුදල් සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා 2022-12-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **යෝජිත ඉන්දියා - ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුමේ (ETCA) 12 වැනි වටයේ සාකච්ඡාව**

යෝජිත ඉන්දියා - ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA) සම්බන්ධයෙන් වන 12 වැනි වටයේ සාකච්ඡා 2023-10-30 දින සිට 2023-11-01 දින දක්වා කොළඹදී පවත්වනු ලැබ ඇති අතර එහිදී අදාළ ක්ෂේත්‍රයන් කිහිපයක් සම්බන්ධයෙන්ම දෙපාර්ශ්වයේ ක්‍රියාකාරී කණ්ඩායම් විසින් එකඟතාවන්ට පැමිණ ඇත. යෝජිත ගිවිසුම සම්බන්ධයෙන් වන 13 වන සාකච්ඡා වටය 2024-01-08 දින සිට 2024-01-10 දින දක්වා ඉන්දියාවේදී පැවැත්වීමටත්, 2024 මාර්තු මාසය වන විට තාක්ෂණික මට්ටමේ සාකච්ඡා අවසන් කිරීමටත් දෙපාර්ශ්වය එකඟ වී ඇත. 12 වැනි වටයේ සාකච්ඡා සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

10. **ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය 2024 වර්ෂයේ සිට රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කිරීම**

2024 වර්ෂයේ සිට ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික වැඩපිළිවෙල මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ආරම්භ කරනු ලැබ ඇත. එකී ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස නව ආයතනයක් ස්ථාපනය කිරීමකින් තොරව දැනට පවතින ආයතන පද්ධතිය තුළම ආයතන ව්‍යූහයක් නිර්මාණය කිරීම යෝග්‍ය බවට හඳුනාගෙන තිබේ. එසේම, සිදු කරනු ලබන ඇගයීම්වල නිර්දේශයන් වාර්ෂිකව අමාත්‍ය මණ්ඩලය වෙතත්, ඉන් අනතුරුව අදාළ වන පරිදි පාර්ලිමේන්තුව වෙතත් ඉදිරිපත් කිරීමට සහ ඇගයීම් ක්‍රියාවලිය තුළ විවිධ අවස්ථාවලදී ස්වාධීන තීරණයන්ට එළඹීමට හැකි වන පරිදි නිත්‍ය ජාතික ඇගයීම් කමිටුවක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුවක් පත් කිරීම සඳහාත්, එම කමිටුවේ ඇගයීම්වලදී අනාවරණය වන කරුණු පිළිබඳ තොරතුරු සහ එහි නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහාත් අවශ්‍ය පියවර ගැනීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************